*සැ. යු.* - 2019.07.26 දින පළ වූ අංක 2,134 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,135 - 2019 අගෝස්තු මස 02 වැනි සිකුරාදා - 2019.08.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1408 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඳුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1433 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*-(i) සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත, 2019 ජූලි මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.*

(ii) ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306ඒ- ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත, 2019 ජූලි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අගෝස්තු මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## මහරගම නගර සභාව

මහරගම නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2019.08.20 වන දින දක්වා භාරගනු ලැබේ.

අයදුම්පත් "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට 2019.08.20 වන දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩු කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

01. *තනතුර හා වැටුප් පරිමාණය* :
සෞඛ්‍ය කම්කරු (වැඩ ක්ෂේත්‍ර කම්කරු) : රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410
රා.ප.ච. 3/2016 (උපලේඛන II අනුව)

02. *බඳවා ගන්නා ශ්‍රේණිය* : III ශ්‍රේණිය

03. *අධ්‍යාපන සුදුසුකම්* : 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

04. *වෘත්තීය සුදුසුකම්* : අදාළ නැත

05. *පළපුරුද්ද* : අදාළ නැත

06. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය.
(ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ.)
(iii) මෙම තනතුර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

07. *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.
(ii) සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම.
(iv) යහපත් චරිතයකින් යුක්ත වීම.
(v) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබීම.

08. *වයස් සීමාව* : අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.

09. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්) | 15 | *50%* |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 5 | |
| මුළු ලකුණු | 100 | |

10. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද/මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත පාලන ආයතනවලට අදාළ ආඥාපනත්වල විධිවිධානවලටද, මහරගම නගර සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුකූලව කටයුතු කළ යුතුය.

11. මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මහරගම නගර සභාවේ ලේකම් සතුය.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම්.

2019 ජූලි මස 23 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ............................තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

02. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :
..........................................................................................................................................
..........................................................................................................................................

03. මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
..........................................................................................................................................
..........................................................................................................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

(iii) තාවකාලික ලිපිනය (සිංහලෙන්) :
..........................................................................................................................................
..........................................................................................................................................

05. උපන් දිනය : අවුරුද්ද මාසය දිනය

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු මාස දින

07. ජාතික හැඳුනුම්පත් අංකය :
(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය.)

08. විවාහක/අවිවාහක බව :.....................................................

09. දුරකථන අංක : පෞද්ගලික :.....................................................

10. බස්නහිර පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව :.....................................................
(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.)

11. අධ්‍යාපන සුදුසුකම් :
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

12. පළපුරුද්ද :
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්) :
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. (i) ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද? (ඔව්/නැත)
(ii) ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද?
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ........................................III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා........................................III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

...............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................................

08 - 327

---

## පානදුර නගර සභාව

### පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි අනුව බාහිර වශයෙන් බඳවා ගැනීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, පානදුර නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු තනතුරු :*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත්/වෘත්තීය සුදුසුකම්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීම/ පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III | 02 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. | | PL-1 - 2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410 | ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය හා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සිදු කරනු ලැබේ. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | වෙනත්/වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම/ පළපුරුද්ද |
|---|---|---|---|---|---|---|
| 02 | වැඩ ක්ෂේත්‍ර කම්කරු III | 05 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. | | PL-1 - 2016 රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410 | ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය හා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සිදු කරනු ලැබේ. |
| 03 | මුරකරු III | 01 | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.) | | PL-1 - 2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410 | ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය හා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සිදු කරනු ලැබේ. |
| 04 | රියදුරු III | 03 | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) ක් අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.) | බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් 'ඒ' 1 සහ 'සී' 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී' 1 පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගී 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ) මූලික සුදුසුකම වශයෙන් ලබා තිබිය යුතුය. | PL-3 - 2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මගින් සිදු කරනු ලැබේ.<br><br>වෘත්තීය පරීක්ෂණය :<br><br>(1) රිය පැදවීමේ නිපුණත්වය<br><br>(2) මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br><br>(3) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම<br><br>පළපුරුද්ද :<br><br>(1) බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>(2) අවම උස අඩි 5ක් විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | වෙනත්/වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම/ පළපුරුද්ද |
|---|---|---|---|---|---|---|
| | | | | | | (3) දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. (රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.) |
| 05. | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු III | 01 | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.) | 1. බරවාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මඟීන් 32ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ) ලබා තිබිය යුතුය.<br><br>2. අවම උස අඩි 5 ක් විය යුතුය.<br><br>3. බර යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීම පිළිබඳව තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදාළ සහතික පතක් තිබිය යුතුය.<br><br>4. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුමක් තිබීම. | රා.ප.ච. 3/2016 අනුව)<br>PL-3 - 2016<br>රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | බඳවා ගැනීම<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.<br><br>01. මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br><br>02. යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br><br>03. ප්‍රායෝගික පරීක්ෂණය<br>පළපුරුද්ද :<br><br>බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | වෙනත්/වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම/ පළපුරුද්ද |
|---|---|---|---|---|---|---|
| 06 | කාර්යාල කාර්ය සහයක III | 01 | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.) | | PL-1 - 2016 (රා.ප.චි. 3/2016 අනුව) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410 | ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමා-න්‍ය අවබෝධය හා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සිදු කරනු ලැබේ. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

i. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

iii. බස්නාහිර පළාත තුළ අවුරුදු 03 ක ස්ථිර පදිංචි ඇති අයකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.)

iv. පානදුර නගර සභා ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

v. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

vi. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

vii. රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතුය.

viii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

ix. පානදුර නගර සභාවේ දැනට අනියම්/ආදේශ/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධ-යෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

x. මෙම ආයතනයේ ඕනෑම ස්ථානයක තනතුරට අදාළ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාව යෙන්ද යුක්ත විය යුතුය.

xi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

xii. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම, පානදුර නගර සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. ස්ථිර සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.

ii. වැන්දඹු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

iii. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

iv. මෙම බඳවා ගැනීම් කොන්දේසි හි රෙගුලාසි වලට අමතරව, ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, රජයේ මුදල් රෙගුලාසි වලටද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, බස්නාහිර පළාත් සභාව හෝ පානදුර නගර සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික
iii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
iv. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය

වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික

05. ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත අදළ සියලුම සහතික සමග 2019.08.15 දිනට ප්‍රථම පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පානදුර නගර සභාව වෙත ගෙනැවිත් භාර දිය හැක.

ටී. මානෙල් සියඹලාගොඩ,
ලේකම්,
පානදුර නගර සභාව,
පානදුර.

2019 ජූලි මස 17 වැනි දින.

**පානදුර නගර සභාවේ .............................තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :——————————

(i) මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————

02. ස්ථිර ලිපිනය :——————————

03. උපන් දිනය ඃ අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————

06. දුරකථන අංකය : | | | | | | | | | | |

07. විවාහක/අවිවාහක බව :——————————

08. අධ්‍යාපන සුදුසුකම් ඃ

8.1 අයදුම්කරු අවසන් වරට සමත් වූ පන්තිය :——————————

8.2 අ.පො.ස (සා/පෙළ) විභාගය ඃ

i. වර්ෂය ඃ......................... මාසයඃ................................
ii. විභාග අංකයඃ ——————
iii. ප්‍රතිඵල ඃ

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

8.3 අ.පො.ස. (උ/පෙළ) විභාගය :
(i) වර්ෂය :...................................... මාසය :.................................
(ii) විභාග අංකය :..........................................
(iii) ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :
..........................................................................................................................................................................................
..........................................................................................................................................................................................

10. වෙනත් සුදුසුකම් :
..........................................................................................................................................................................................

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?
..........................................................................................................................................................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් වීම ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමටද යටත්වන බවද මම දනිමි.

.............................................;
අයදුම්කරුගේ අත්සන.

දිනය :....................................

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම ආයතනයේ ..................................................තනතුරු දරන ..........................................................මයා/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ හැසිරීම් සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

. ............................................;
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

දිනය :....................................

08-121

## අලව්ව ප්‍රාදේශීය සභාව

### ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

02.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ප්‍රමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රා.ප.ච.ලේ 3/2016 PL1 - 2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රා.ප.ච.ලේ 3/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ.) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 2 ක් සමත් විය යුතුය. |
| 02 | මුරකරු | 01 | | |

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරු අයදුම්පත්‍ර භාර ගන්නා අවසා දිනට පූර්වාසන්න වසර (03) නොඅඩු කාලයක් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ විය යුතුය.)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්තවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වසර 03 පරිවාස කාලයකට යටත් වේ.

(ii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි වලටද මුදල් රෙගුලාසි වලටද රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද, අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුය.

06. *අයදුම්පත ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙළ කරගන්නා ලද අයදුම්පත 2019.08.31 හෝ එදිනට පෙර "ලේකම්, අලව්ව ප්‍රදේශීය සභාව, අලව්ව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත සමග ඉහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සහතිකය

(ඇ) අස්වීමේ සහතිකය

(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය
(ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)

(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්

(ඊ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික

මෙම අයදුම්පත් කැඳවීමකින් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ආර්. ඩී. කේ. අමරජීව,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

2019 අගෝස්තු මස 02 වැනි දින.
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

**අලව්ව ප්‍රාදේශීය සභාවේ ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම - 2019**

***.............................................තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————————
02. මුලකුරු වලින් හැඳින්වෙන නම :————————————
03. ස්ථිර ලිපිනය :————————————
04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:————————————
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————————————
06. දිස්ත්‍රික්කය:————————————
07. උපන් දිනය
    වර්ෂය:———— මාසය:———— දිනය:————
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ
    අවුරුදු :———— මාස :———— දින:————
09. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද යන වග?:————————————
11. විවාහක/අවිවාහක යන වග:————————————
12. ජාතික හැඳුනුම්පත් අංකය:————————————
13. අධ්‍යාපන සුදුසුකම්:————————————
14. වෘත්තීය හා වෙනත් සුදුසුකම්:————————————
15. සේවා පළපුරුද්ද :————————————
    *(අ)* දැනට සේවය කරන ආයතනය:————————————
    *(ආ)* දැනට දරන තනතුර:————————————
    *(ඇ)* එම තනතුරට පත් වූ දිනය:————————————
    *(ඈ)* මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන තනතුර:————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

.............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ....................................

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි."

..........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය .................................
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

---

## කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2114 හා 2019.03.08 දින පලකරන ලද *ගැසට්* පත්‍රයේ 03-633 නිවේදනයේ අනු අංක 02 හා 03 හි සඳහන් කරුණු මින් අවලංගු කරන අතර, පහත උපලේඛනයේ සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරවරයා විසින් 2008.11.19 දිනැති අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති, කරුවලගස්වැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | සේවක ගණය | ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | සුදුසුකම් |
|---|---|---|---|---|---|---|
| 01. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 04 | පී. එල්. 1-2016 (3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව) | රජය විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුයි. |
| 02. | පුස්තකාල උපස්ථායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 02 | පී. එල්. 1-2016 (3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 03. | කාර්යාල කාර්ය සහායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 01 | පී. එල්. 1-2016 (3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |

02. *බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන් කරුවලගස්වැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු අතර කරුවලගස්වැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාත කිරීම සඳහා ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් ග්‍රාම නිලධාරිගේ සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ)
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවන් කරනු ලැබූවකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.
6. දැනටමත් කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කෙරේ.
7. දැනට් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු අයදුම්පත් භාරගන්නා අවසන දිනට පූර්වාසන්න වසර 5 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල මත සුදුසුකම් ලත් අය බඳවා ගනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
3. බඳවාගනු ලබන සේවයකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.
4. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු වේ.
5. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලටද, මුදල් රෙගුලාසි වලටද, ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටී.
6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතුරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2019.08.20 වැනි දිනයට හෝ ඊට පෙර ලේකම්, කරුවලග ස්වැව ප්‍රාදේශීය සභාව, කරුවලගස්වැව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු වේ. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුවේ.) අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදසිවල ඉදිරිපත් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :

අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී මුල් සහතික ඉදිරිපත් කළ යුතුවේ :-

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය,
4. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීවරයාගෙන් විය යුතු ය.)
5. සේවා සහතිකය, (දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි.)
6. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තන වල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

එස්. ඩී. ටී. උපේන්ද්‍රා ධර්මරානි,
ලේකම්,
කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.

2019 ජූලි මස 22 වැනි දින,
කරුවලගස්වැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**වයඹ පළාතේ කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ.......................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. (අ) මුලකුරු සමග නම :————————————.
   (ආ) සම්පූර්ණ නම :————————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————. ප්‍රා. ලේ. කොට්ඨාසය :————————————.
   ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————————————.
3. ස්ථිර පදිංචි ලිපිනය :————————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
5. උපන් දිනය අවුරුද්ද:——————. මාසය :——————. දිනය:——————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————. විවාහක/අවිවාහක බව :——————
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු :————. මාස :————. දින:————.
8. කරුවලගස්වැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :——————.
9. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:——————.
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාග පිළිබඳ විස්තර) :——————.
11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය):——————.
12. ඔබ දැනටමත් මෙම ආයතනයේ සේවය කරන්නේ නම් තනතුර හා සේවා කාලය:——————.
    (පත්වීමේ ස්වභාවය ඃ ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/දීමනා පදනම මත ද, යන වග):——————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තොරාගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ..........................................

*දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා වන ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන............................................................ මහතා/මිය/මෙනවිය............................................. දින සිට මෙම කාර්යාලයේ...................................................... වශයෙන් සේවය කරනු ලබයි. ඉහත තනතුරට තෝරා පත් කරනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොන ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..........................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව යොදන්න)

නම :....................................................
පදවි නාමය :...................................................
දෙපාර්තමේන්තුව/ආයතනය :...................................................
දිනය :...................................................

08-324

## පානදුර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පානදුර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා විවෘත/සීමිත යටතේ බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි හා සේවා කොන්දේසි :*

01. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් හෝ පදිංචිය සනාථ කළ යුතුය.)
03. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුයි. (රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.) සෞඛ්‍ය පරිපාලක තනතුර හා වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා පමණක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු.18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුයි.
04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.
05. විශිෂ්ට චරිතයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය නියමිත සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය්‍ය වේ.
07. ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, මුදල් රෙගුලාසි හා බස්නාහිර පළාත් සභාවේ කාර්යය පරිපාටික හා මූල්‍ය නීති, රෙගුලාසි හා නියෝගවලටද, පානදුර ප්‍රාදේශීය සභාව විසින් වරින් වරට නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
08. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්ති තීරණයට ඔබ යටත් විය යුතුය.
09. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ව තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුතුය.
10. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා විධිවිධාන හා ඊට අනුශාංගික වන චක්‍රලේඛ විධිවිධාන අනුව මෙම පත්වීම භාරගත් දින සිට වසර 05 ක් ඉකුත් වීමට පෙර, අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.
11. ක්‍රීඩා කුසලතා/සෞන්දර්ය දක්ෂතා/පරිගණක හැකියාව ආදී වෙනත් බාහිර සුදුසුකම් හා දක්ෂතා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. තනතුරුවලට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර එමගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
02. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
03. පානදුර ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවාවේ නියුතු වූවන් හා පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
04. රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට අමතරව වෘත්තීය පරීක්ෂණයකටද භාජනය කරනු ලැබේ.
05. සෞඛ්‍ය පරිපාලක තනතුර හා වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට අමතරව ලිඛිත විභාග යක් ද පැවැත්වේ. සීමිත අයදුම්කරුවන් නොමැති වුවහොත් විවෘත අයදුම්කරුවන්ගෙන් අදාළ පුරප්පාඩු පුරවනු ලැබේ.
06. අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කෙරෙන හෝ සහතික වල ඡායාපිටපත් අමුණා නැති හෝ අදාළ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
07. ඔබ විසින් සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලබන අතර එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කරනු ලැබේ.

<table>
<tr><th>අනු අංකය</th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු ගණන</th><th>අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්</th><th>වැටුප් පරිමාණය</th><th>බඳවා ගැනීමේ ක්‍රමවේදය</th></tr>
<tr><td>01</td><td>සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය</td><td>02</td><td>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමර්ථ ලබා ගැනීම. (මින් විෂයයන් පහ(05) ක් එකවර සමත්විය යුතුයි.</td><td>MNI-2016.<br>රු. 27,140 - 10 x300 -11x350 -10x495- 10 x 660 - රු. 45,540</td><td>බඳවා ගැනීමේ ක්‍රමවේදය - සීමිත බඳවා ගැනීම<br>පළාත් පාලන ආයතනයක PL-1 සහ PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයන් විය යුතු අතර සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය.<br><br>වයස -<br>දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාව අදළ නොවේ.<br>බඳවා ගැනීමේ ක්‍රමවේදය - ලිඛිත විභාගය
<table>
<tr><th>විෂයයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය</td><td>100</td><td>40%</td></tr>
<tr><td>ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය</td><td>100</td><td>40%</td></tr>
</table>
පවත්වන බලධරයා අදළ පත්වීම් බලධාරියා -<br>ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.<br><br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
<table>
<tr><th>ලකුණු ලබා දෙන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>සපුරා ලිය යුතු ස්ථිර සේවා කාලයට, අමතර සේවා කාලයට</td><td>15</td><td rowspan="4">25</td></tr>
<tr><td>වැඩ බැලීම හා රාජකාරී ඉටු කිරීම</td><td>10</td></tr>
<tr><td>ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂණය</td><td>20</td></tr>
<tr><td>පෞරුෂත්වය</td><td>05</td></tr>
</table>
</td></tr>
</table>

<table>
<tr><th>අනු අංකය</th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු ගණන</th><th>අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්</th><th>වැටුප් පරිමාණය</th><th>බඳවා ගැනීමේ ක්‍රමවේදය</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බැලේ.<br>විවෘත බඳවා ගැනීම - සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය<br><br>අධ්‍යාපන සුදුසුකම් :<br><br>අ.පො.ස. (සා. පෙළ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ<br><br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>බඳවා ගැනීමේ ක්‍රමය :<br>ලිඛිත විභාගය
<table>
<tr><th>විෂයයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය</td><td>100</td><td>40%</td></tr>
<tr><td>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>100</td><td>40%</td></tr>
</table>
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - මෙහිදී ලකුණු ලබාදෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා පමණක් පවත්වනු ලැබේ.</td></tr>
<tr><td>02.</td><td>වැඩ/ක්ෂේත්‍ර පරිපාලක III ශ්‍රේණිය</td><td>01</td><td>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා ගැනීම. (මින් විෂයයන් පහ(05) ක් එකවර සමත්විය යුතුයි.</td><td>MNI-2016. රු. 27,140 - 10 x 300 -11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540</td><td>බඳවා ගැනීමේ ක්‍රමවේදය - සීමිත බඳවා ගැනීම . ක්ෂේත්‍ර පරිපාලක III<br><br>පළාත් පාලන ආයතනයක PL-1 සහ PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයන් විය යුතු අතර සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය.<br><br>වයස -<br>දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.</td></tr>
</table>

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීමේ ක්‍රමවේදය |
|---|---|---|---|---|---|
| | | | | | *බඳවා ගැනීමේ ක්‍රමවේදය - ලිඛිත විභාගය*<br><br>විෂයයන් / උපරිම ලකුණු ප්‍රමාණය / සමත් ලකුණු ප්‍රමාණය:<br>සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය — 100 — 40%<br>ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය — 100 — 40%<br><br>පවත්වන බලධරයා අදළ පත්වීම් බලධාරියා -<br><br>ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.<br><br>*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*<br><br>ලකුණු ලබා දෙන ශීර්ෂ / උපරිම ලකුණු ප්‍රමාණය / තෝරා ගැනීමට සලකා බලනු ලබන ලකුණු ප්‍රමාණය:<br>සපුරා ලිය යුතු ස්ථිර සේවා කාලයට, අමතර සේවා කාලයට — 15<br>වැඩ බැලීම හා රාජකාරී ඉටු කිරීම — 10<br>ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂණය — 20<br>පෞරුෂත්වය — 05<br>(සියල්ල සඳහා) — 25<br><br>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බැලේ. |

<table>
<tr><th>අනු අංකය</th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු ගණන</th><th>අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්</th><th>වැටුප් පරිමාණය</th><th>බඳවා ගැනීමේ ක්‍රමවේදය</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td>
විවෘත බඳවා ගැනීම - ක්ෂේත්‍ර පරිපාලක III<br><br>
අධ්‍යාපන සුදුසුකම් :<br><br>
අ.පො.ස. (සා. පෙළ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ<br><br>
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>
බඳවා ගැනීමේ ක්‍රමය :<br><br>
ලිඛිත විභාගය<br>
<table>
<tr><th>විෂයයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය</td><td>100</td><td>40%</td></tr>
<tr><td>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>100</td><td>40%</td></tr>
</table><br>
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - මෙහිදී ලකුණු ලබාදෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා පමණක් පවත්වනු ලැබේ.
</td></tr>
<tr><td>03</td><td>රියැදුරු III ශ්‍රේණිය</td><td>01</td><td>
• අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයයන් 05 ක් එක වරකදී සමත් වී තිබිය යුතුය.<br><br>
• කසල ප්‍රවාහන ට්‍රැක්ටර් රථ සඳහා බඳවා ගැනීමේදී 8 ශ්‍රේණිය සමත් (9 වසර) වූවන් කෙරෙහි සැලකිලිමත් වේ.
</td><td>රු. 25,790 -<br>10 x 270 -<br>10 x 300 -<br>10 x 330 -<br>12 x 350 -<br>රු. 38,990<br>(PL-3-2016)</td><td>
විවෘත බඳවා ගැනීම<br>
(01) ලිඛිත පරීක්ෂණය<br><br>
පළාත් පාලන රියැදුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය පිළිබඳ විස්තර<br>
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රය</th><th>කාලය</th><th>මුළු ලකුණු</th><th>සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>01. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</td><td>පැය 01</td><td>100</td><td>40</td></tr>
<tr><td>02. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</td><td>පැය 01</td><td>100</td><td>40</td></tr>
</table>
</td></tr>
</table>

<table>
<tr><th>අනු අංකය</th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු ගණන</th><th>අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්</th><th>වැටුප් පරිමාණය</th><th>බඳවා ගැනීමේ ක්‍රමවේදය</th></tr>
<tr><td></td><td></td><td></td><td>
වෘත්තීය සුදුසුකම් :<br><br>
• මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බී. සී. හා සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ඩී (D) පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම හා අවම වසර තුනක (03) පළපුරුද්ද<br><br>
• රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වැනි මට්ටම ( NVQ - 4) සහතිකය<br><br>
• මහා මාර්ග නීති පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.<br><br>
කායික සුදුසුකම් :<br><br>
• සෑම අපේක්ෂකයෙකුටම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.<br><br>
• අවම උස අඩි 05, අඟල් 02 1/2 ක් විය යුතුය.<br><br>
පළපුරුද්ද :<br><br>
• මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.<br><br>
(පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)
</td><td></td><td>
01. මෙම පරීක්ෂණය අදාළ පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලැබේ.<br><br>
02. තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.<br><br>
03. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබා ගත යුතු වේ.<br><br>
විභාගය සඳහා විෂය නිර්දේශය<br><br>
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>විෂය නිර්දේශය</th></tr>
<tr><td>1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</td><td>මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.</td></tr>
<tr><td>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</td><td>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.</td></tr>
</table><br>
5. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
</td></tr>
</table>

<table>
<tr><th>අනු අංකය</th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු ගණන</th><th>අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්</th><th>වැටුප් පරිමාණය</th><th>බඳවා ගැනීමේ ක්‍රමවේදය</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td>(02) වෘත්තීය පරීක්ෂණය
<table>
<tr><th>පරීක්ෂා කර ලකුණු ලබාදෙන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. රිය පැදවීමේ නිපුණතාවය/ යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය/ යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය</td><td>40</td><td rowspan="4">ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.</td></tr>
<tr><td>2. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම</td><td>40</td></tr>
<tr><td>3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</td><td>20</td></tr>
<tr><td>මුළු ලකුණු</td><td>100</td></tr>
</table>
</td></tr>
<tr><td>04</td><td>ආදහනාගාර ක්‍රියාකරු සහායක III ශ්‍රේණිය</td><td>01</td><td>• දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ විභාගය සමත්ව තිබීම. මින් විෂයයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතුයි. මෙම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයවලුන් නොමැති විටදී ඊට අඩු සුදුසුකම් 8 ශ්‍රේණිය (9 වසර) සමත් ඇති අය පිළිබඳව සලකා බලනු ලැබේ.</td><td>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10x 330 - 12 x 330 රු. 36,410 (PL-1-2016)</td><td>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ</td></tr>
</table>

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීමේ ක්‍රමවේදය |
|---|---|---|---|---|---|
| 05 | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | • අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනාවකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 ට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් විය යුතුය. | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10x 330 - 12 x 330 - රු. 36,410 (PL-1-2016) | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ |
| 06 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 01 | • 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10x 330 - 12 x 330 රු. 36,410 (PL-1-2016) | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ |
| 07 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 06 | • 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10x 330 - 12 x 330 රු. 36,410 - (PL-1-2016) | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ |
| 08 | නගර ශාලා භාරකරු III ශ්‍රේණිය | 01 | • දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ විභාගය සමත්ව තිබීම. මින් විෂයයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතුයි. මෙම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයවලුන් නොමැති විටදී ඊට අඩු සුදුසුකම් 8 ශ්‍රේණිය (9 වසර) සමත් ඇති අය පිළිබඳව සලකා බලනු ලැබේ. | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10x 330 - 12 x 330 - රු. 36,410 (PL-1-2016) | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ |

*අයදුම් කිරීමේ පිළිවෙල :*

01. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් තමා විසින්ම පිළියෙල කළ අයදුම්පතක් 2019.08.16 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, ගාලු පාර, වාද්දුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ඉල්ලුම් කරන තනතුර" සම්පූර්ණයෙන් සඳහන් කළ යුතුය.

03. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපතක් අමුණා එවිය යුතුය :

I. උප්පැන්න සහතිකය
II. අධ්‍යාපන සහතික
III. ජාතික හැඳුනුම්පත
IV. ශිෂ්‍ය කාර්ය දර්ශනය (පාසල හැරයාමේ සහතිකය)
V. පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය
VI. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්

04. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

05. නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නැති අයදුම්පත් හෝ අදාළ සුදුසුකම් නැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එච්. ඒ. ජයලතා,
ලේකම්,"ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

ආදර්ශ අයදුම්පත

**පානදුර ප්‍රාදේශීය සභාව**

***...............................................තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

01. (අ) මුලකුරු සමග නම :———————————
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :———————————
02. පෞද්ගලික ලිපිනය :———————————
03. ජාතික හැඳුනුම්පත් අංකය :———————————
04. දුරකථන අංකය:———————————
05. උපන් දිනය (උප්පැන්න සහතිකය ඇමිණිය යුතුය):———————————
06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2019.08.16) වයස :———————————
07. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:———————————
08. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය ඃ
09. (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? :———————————
(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? :———————————
10. ස්ත්‍රී/පුරුෂ භාවය:———————————
11. විවාහක/අවිවාහක බව :———————————
12. අධ්‍යාපන සුදුසුකම්/සමත් වී ඇති ඉහළම විභාගය (ඡායා පිටපත් ඇමිණිය යුතුය.) :———————————
13. (අ) පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:———————————
(ආ) වෙනත් සුදුසුකම් :———————————
14. (අ) ඔබට කුමන හෝ වරදකට අධිකරණයකින් දඬුවම් පනවා තිබේ ද ?:———————————
(ආ) එසේ නම් දඬුවමේ ස්වභාවය :———————————
(15) ඔය දැනට මෙම සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය සේවා විස්තරය හා තනතුරේ ස්වභාවය (අනියම්, ස්ථිර නොවන ආදේශක, ගිවිසුම් පදනම් මත, ව්‍යාපෘති පදනම) :———————————

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍යය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුරට මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

.............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ.....................................

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..............................දින සිට ..........................දින දක්වා .......................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් මුදාහල හැක./නොහැක. ඔහු ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) භාජනය වී නොමැති බව මෙයින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

..........................................
ආයතනයේ ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය ................................

08-310

---

## කටුවන ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ (පළාත් පාලන) පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

| *අනු. අංකය* | *තනතුර* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | III | 01 | PL-02 - 2016 රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත් වී තිබීම සහ අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02 | පුස්තකාල සහායක | III | 01 | PL-01 - 2016 රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. |
| 03 | සෞඛ්‍ය කම්කරු | III | 02 | PL-01 - 2016 රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | අට ශ්‍රේණිය (9 වසර) සමත්වීම |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශරීර යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 03 කට වැඩි කාලයක් දකුණු පළාතේ ස්ථිරව පදිංචි විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් ස්ථිර තනතුරක නිරත අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
5. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.

6. දැනටමත් කටුවන ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

7. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ නීතිවලට ද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද, කටුවන ප්‍රාදේශීය සභාව පනවනු ලැබ ඇති හා වරින් වර පනවනු ලබන නීතිරීති වලට ද යටත් විය යුතුය.

8. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. සියලුම තනතුරු ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිවලට ඔබ යටත් විය යුතුයි.

2. පත්වීම් දින සිට වසර 3 ක පරිවාස කාලයකට යටත්ව එම කාලය තුළ සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබේනම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට මුදල් ගෙවිය යුතුය.

3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු වේ.

4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

04. තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමානය :

| | |
|---|---|
| * අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය - 30 |
| * අමතර සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය - 10 |
| * පළපුරුද්ද | උපරිම ලකුණු ප්‍රමාණය - 10 |
| * සභා බල ප්‍රදේශයේ පදිංචිය (වසරකට ලකුණු 5 බැගින්) | උපරිම ලකුණු ප්‍රමාණය - 45 |
| * සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | උපරිම ලකුණු ප්‍රමාණය - 05 |
| (තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය 50%) | |

05. අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලි වල පිටපත් ද එවිය යුතුය. (මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය)

* උප්පැන්න සහතිකය
* අධ්‍යාපන සහතික
* ජාතික හැඳුනුම්පතේ පිටපතක්
* තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් සහිත ග්‍රාම සේවා සහතිකය
* සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
* මෑතකදී ලබාගත් චරිත සහතික 2 ක්

(මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.)

06. අයදුම්පත් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘති අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව, මිද්දෙනිය යන ලිපිනයට 2019.08.23 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුයි. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

අයි. ජී. මහින්ද,  
සභාපති,  
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 ක් වූ ජූලි මස 18 වැනි දින,  
කටුවන ප්‍රාදේශීය සභාව,  
මිද්දෙනිය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කටුවන ප්‍රාදේශීය සභාව***

*......................................................... තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය*

01. (අ) මුලකුරු සමග නම :——————————

(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————

02. පෞද්ගලික ලිපිනය :——————————

03. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

04. (අ) උපන් දිනය : අවුරුද්ද:—————— මාසය:—————— දිනය:——————

(ආ) 2019.08.23 දිනට වයස : අවුරුදු:—————— මාස:—————— දින:——————

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————

07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————————

08. විවාහක/අවිවාහක බව :——————————

09. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :——————————

10. ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම් :——————————

10.1 අධ්‍යාපන සුදුසුකම් අ.පො.ස. (සා. පෙළ) විභාග අංකය:—————— වර්ෂය:——————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10.2 අධ්‍යාපන සුදුසුකම් අ.පො.ස. (උ. පෙළ) විභාග අංකය:—————— වර්ෂය:——————

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෙනත් සුදුසුකම් :——————————

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————

13. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේ ද?:——————————

* එසේ නම් දඬුවමේ ස්වභාවය :——————————

14. ඔබ දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය හෝ කටුවන ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර ඃ

* දැනට දරන තනතුර :——————

* එම තනතුරට පත් වූ දිනය:——————

* එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/දෛනික පදනම ද යන):——————

මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

දිනය :—————— අයදුම්කරුගේ අත්සන.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ආයතනයේ................................. ලෙස සේවය කරනු ලබන.............................................. මයා/මිය/මෙය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:——————
තනතුර:——————
දිනය:——————

08-429

# පළාත් පාලන නිවේදන

## හෝමාගම ප්‍රාදේශීය සභාව

### ත්‍රී රෝද රථ ගාල් හා ඒවායේ නවතා තැබිය හැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව

හෝමාගම ප්‍රාදේශීය සභාවේ 2019.02.18 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 5:111 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 16 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1997 අංක 06 හා 2015 දෙසැම්බර් 28 වැනි දින අති විශේෂ *ගැසට් පත්‍රය* මගින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 2016.09.23 වන දින අංක 1986 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභාව මගින් වැළඳගත් ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් ත්‍රී රෝද රථගාල් පිහිටුවීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

| | *රථගාල* | *රථගාලේ සංකේත අංකය* | *එකවර නවතා තැබිය හැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව* | *ලියාපදිංචි ත්‍රී රෝද රථ සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| 01 | හෝමාගම පොදු වෙළඳපල ඉදිරිපිට | හෝ/ප්‍රාස/රථගාල/14 | 05 | 21 |
| 02 | පිටිපන උතුර කිරිබේරියකැලේ හන්දිය | හෝ/ප්‍රාස/රථගාල/15 | 02 | 08 |

08-52

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | රු. ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019** වර්ෂය | | | |
| **අගෝස්තු** | 2019.08.02 | සිකුරාදා | 2019.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.09 | සිකුරාදා | 2019.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.16 | සිකුරාදා | 2019.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.23 | සිකුරාදා | 2019.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.30 | සිකුරාදා | 2019.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2019.09.06 | සිකුරාදා | 2019.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.09.12 | බ්‍රහස්පතින්දා | 2019.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.09.20 | සිකුරාදා | 2019.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.09.27 | සිකුරාදා | 2019.09.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2019.10.04 | සිකුරාදා | 2019.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.11 | සිකුරාදා | 2019.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.18 | සිකුරාදා | 2019.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.25 | සිකුරාදා | 2019.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.